# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

අංක **2423/21 - 2025** පෙබරවාරි මස **13** වැනි බ්‍රහස්පතින්දා - **2025.02.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2023/191.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව -

බී.ඒ. කේ.සුදර්ශිකා මිය, අංක 389/3, ගම්මාන පාර, කිරිවත්තුඩුව.

*සහ*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක. 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය මහාචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ගාල්ල, කිතුලම්පිටිය, වේවැල්වල පාර, අංක 10/51 වසන්ත වික්‍රමරත්න පුංචිහේවා මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මහාචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**

කම්කරු අමාත්‍ය.

2025 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2023/191.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

බී.ඒ.කේ.සුදර්ශිකා මිය, අංක 389/3, ගම්මාන පාර, කිරිවත්තුඩුව.

*සහ*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක. 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,**

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ලිපිකාරිණියක ලෙස සේවය කරන බී.ඒ.කේ. සුදර්ශිකා මිය VIII ශ්‍රේණියේ තනතුරක නොපිහිටුවීම මගින් ඇයට අසාධාරණයක් සිදුවී තිබේද යන්නත්, එසේ අසාධාරණයක් සිදුවී තිබේනම් ඇයට හිමිවිය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ."

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජනවාරි මස 16 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 02 - 0118

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.